සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

25859

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**22 S I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

# භූගෝල විද්‍යාව I (ප්‍රායෝගික භූගෝල විද්‍යාව)
## புவியியல் I (செய்முறைப் புவியியல்)
## Geography I (Practical Geography)

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**අයදුම්කරුවන්ට උපදෙස් :**

※ පළමුවැනි කොටසෙන් **ප්‍රශ්න අංක 1** ද, දෙවැනි කොටසෙන් **ප්‍රශ්න අංක 2** ද, තුන්වැනි සහ හතරවැනි කොටස්වලින් ප්‍රශ්න **එක** බැගින් ද තෝරා ගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

※ (1) 1:50,000 බිබිලේ භූ ලක්ෂණ සිතියමෙන් කොටසක්
(2) 10 cm × 10 cm ප්‍රමාණයේ සමචතුරස්‍රයක් සහිත ඇඳීමේ කඩදාසියක්
(3) ප්‍රස්තාර කඩදාසි දෙකක්
(4) ඇඳීමේ කඩදාසි දෙකක්
(5) ලෝක සිතියමක් සපයා ඇත.

## I කොටස

1. (අ) ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශ කරන ලද 1:50,000 පරිමාණයේ බිබිලේ භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් සපයා ඇත. එහි සමෝච්ච රේඛා පරතරය අඩි 100 කි. මෙම සිතියම පදනම් කර ගනිමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**සැලකිය යුතුයි :**

- පිළිතුරු සිතියමෙහි ලිවිය යුතු නො වේ.
- ප්‍රශ්න අංකය සහ අදාළ උප කොටස පිළිතුරු පත්‍රයේ පැහැදිලි ව සඳහන් කළ යුතු ය.
- **සිතියම ඔබේ පිළිතුරු පත්‍රයට ඇමිණිය යුතු නැත.**

(i) භූ විෂමතා ලක්ෂණ **තුනක්** සහ ජලවහන ලක්ෂණ **දෙකක්** සිතියමෙන් හැඳිනගෙන, ඒවා 4 cm × 4 cm ප්‍රමාණයේ කටු සටහන් මගින් ඇඳ නම් කරන්න. (ලකුණු 10 යි)

(ii) සිතියම් ප්‍රදේශයේ භෞතික භූ දර්ශනය හා තේ සහ වී වගාවන්හි අවකාශීය ව්‍යාප්තිය අතර පවතින සබඳතාව පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) B 56 ප්‍රධාන මාර්ගයේ පිහිටි **මැදගම** ආශ්‍රිත ජනාවාස ප්‍රදේශයෙහි දක්නට ඇති සංස්කෘතික ලක්ෂණ **අටක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iv) A 5 සහ B 56 ප්‍රධාන මාර්ගයන්හි **මුළු දිග** ආසන්න වශයෙන් කිලෝමීටරවලින් දක්වන්න. (ලකුණු 01 යි)

(v) සිතියමේ දක්වෙන පරිදි මොනරාගල හා බදුල්ල දිස්ත්‍රික්ක දෙක අතර මාර්ග පද්ධතියෙහි පවතින ප්‍රධාන වෙනස්කම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(vi) අංක 1 චතුරස්‍රයට ඇතුළත්වන ප්‍රදේශයේ වර්ගඵලය වර්ග කිලෝමීටරවලින් දක්වන්න. (ලකුණු 01 යි)

(vii) අංක 1 චතුරස්‍රයේ වට රේඛාව 1 : 100, 000 පරිමාණයට අඳින්න. (ලකුණු 01 යි)

(viii) සිතියම් ප්‍රදේශයේ ස්වාභාවික වෘක්ෂලතා වර්ග **දෙකක්** හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 01 යි)

(ආ) 10 cm × 10 cm ප්‍රමාණයේ සමචතුරස්‍රයක් සහිත ඇඳීමේ කඩදාසියක් ඔබට සපයා ඇත. සම්මත වර්ණ හා සංකේත භාවිත කරමින් පහත දක්වෙන විස්තරයට අනුව එම චතුරස්‍රය තුළ සිතියමක් නිර්මාණය කරන්න.
(සිතියමේ පරිමාණය 1:50,000 ලෙස ද සමෝච්ච රේඛා අන්තරය මීටර 100 ලෙස ද සලකන්න.)

ප්‍රදේශයේ කැපීපෙනෙන භෞතික ලක්ෂණය වනුයේ ගිනිකොන දිග සිට වයඹ දිශාවට භූමිය බෑවුම් වීමයි. එම බෑවුමේ ඉහළ කොටස දළ ස්වභාවයක් ගන්නා අතර, වයඹ දිග ප්‍රදේශයට යන විට මඳ බෑවුම් ස්වභාවයක් ගනී.

ප්‍රදේශයේ 200 m සමෝච්ච රේඛාව බටහිර මායිමේ මධ්‍ය ලක්ෂ්‍යයෙන් ඇරඹී 1 km පමණ ගිනිකොන දෙසට විහිදී, එතැන් සිට 2.25 km ක් නැගෙනහිරට ද, අනතුරුව ඊසාන දිග කෙළවර දක්වා ද වැටී ඇත.

[ දෙවෙනි පිටුව බලන්න.

300 m සමෝච්ච රේඛාව, බටහිර මායිමෙන් ඇරඹී 200 m සමෝච්ච රේඛාවට බොහෝදුරට සමාන්තරව ඊට 1 km ක් පමණ දුරකින් දිවේ. 400 m සමෝච්ච රේඛාව දකුණු මායිමේ හා නැගෙනහිර මායිමේ මධ්‍ය ලක්ෂ්‍යයන් දෙක සම්බන්ධ කරයි. ගිනිකොන කෙළවරෙහි 1012 m ක උන්නතාංශයක් දක්වන ත්‍රිකෝණමිතික ස්ථානයක් වේ.

කොත්කන්දක දකුණු අර්ධය උතුරු මායිමේ දිස්වේ. එය 200 m හා 300 m සමෝච්ච රේඛා මගින් දක්වේ. එම කොත්කන්දෙහි 200 m සමෝච්ච රේඛාව උතුරු මායිමේ මධ්‍ය ලක්ෂ්‍යයෙන් ඇරඹී, ඊසාන දිග කෙළවරේ සිට බටහිරට 1 km ක් දුරින් පිහිටි ලක්ෂ්‍යය දක්වා විහිදී ඇත. කොත්කන්දෙහි, 300 m ට ඉහළ ප්‍රදේශය පාෂාණ උද්ගතයකි.

මෙම ප්‍රදේශයේ ගංගා තුනක් දක්නට ඇත. ගිනිකොන දිග කෙළවරේ සිට 1 km දුරින් දකුණු මායිමෙන් ප්‍රදේශයට ප්‍රධාන ගංගාව ඇතුල්වී 400 m උන්නතාංශය දක්වා උතුරු දෙසට ගලා බසී. එතැන් සිට ප්‍රධාන ගංගාව වයඹ දෙසට ගලා ගොස් වයඹ කෙළවර සිට 2.5 km ගිනිකොන දිගින් පිහිටි ලක්ෂ්‍යයක දී වැවකට ඇතුළු වේ. ප්‍රදේශයේ ගිනිකොන කෙළවර සිට 0.5 km දුරින් නැගෙනහිර මායිමෙන් අතුල්වන අතු ගංගාවක් 400 m උන්නතාංශයේ දී ප්‍රධාන ගංගාවෙහි දකුණු ඉවුරට සම්බන්ධ වේ.

අක්‍රමවත් හැඩයක් ඇති වැවෙහි වපසරිය ආසන්න වශයෙන් 2 km$^2$ කි. 1 km දිග නිරිත-ඊසාන දිශානුසාරීව වැව් බැම්ම වැටී ඇත. එහි මධ්‍ය ලක්ෂ්‍යය පිහිටා ඇත්තේ වයඹ කෙළවරේ සිට 1.5 km ගිනිකොන දෙසට පිහිටි ස්ථානයේ ය.

නිරිත දිග කෙළවරේ සිට 1 km ක් දුරින් දකුණු මායිමෙන් ම ප්‍රදේශයට ඇතුල්වන දෙවැනි ගංගාව බටහිර මායිමට සමාන්තරව 3 km උතුරට ගලා වැවට එකතු වේ. නැගෙනහිර මායිමේ මධ්‍ය ලක්ෂ්‍යයෙන් ප්‍රදේශයට ඇතුල්වන තුන්වැනි ගංගාව වයඹ දිශානුගතව ගලා වැවට ඇතුල්වනුයේ ප්‍රධාන ගංගාවට 0.5 km දුරිනි.

බටහිර මායිමේ මධ්‍ය ලක්ෂ්‍යයෙන් ප්‍රදේශයට ඇතුල්වන ප්‍රධාන මාර්ගය වැව් බැම්ම දිගේ ගොස්, එතැන් සිට ඊසාන කෙළවරින් 1 km ක් දුරින් පිහිටි ලක්ෂ්‍යකින් නැගෙනහිර මායිමෙන් පිටවේ. උතුරු මායිමේ මධ්‍ය ලක්ෂ්‍යයෙන් ඇතුල්වන අප්‍රධාන මාර්ගය වැව් බැම්මේ ඊසාන කෙළවරෙහි දී ප්‍රධාන මාර්ගය හා එක්වේ.

2 km$^2$ වපසරියකින් යුක්ත වන කුඹුරු යාය වැව් බැම්මේ සිට උතුරු හා බටහිර මායිම් දක්වා පැතිරී ඇත.

පාසලක් සහිත පොකුරු ජනාවාසයක් මංසන්ධිය අසල පිහිටා ඇත. 1.5 km$^2$ ක පමණ ගෙවතු ප්‍රදේශය උතුරු මායිම දක්වා විහිදේ. පාෂාණ උද්ගතය මුදුනේ බෞද්ධ සිද්ධස්ථානයක් දක්නට ලැබේ. අඩි පාරක් මගින් සිද්ධස්ථානය හා ජනාවාසය සම්බන්ධ කෙරේ. 300 m හා 400 m උන්නතාංශ අතර, තැනින් තැන හේන් වගාව පැතිරී ඇත. 500 m ඉහළ ප්‍රදේශය සම්පූර්ණයෙන්ම ලඳු කැළෑවලින් වැසී ඇත. (ලකුණු 16 යි)

## II කොටස

**2.** සපයා ඇති ලෝක සිතියමෙහි පහත සඳහන් දෑ ලකුණු කොට නම් කරන්න.

(අ) කාර්පේතියන් කඳු, ඩැනියුබ් ගඟ, මලාවි විල, කොලරාඩෝ සානුව, ස්ටෙප්ස් තණ බිම්, මහා වාලුකා කාන්තාරය (Great Sandy Desert), යෙලෝස්ටෝන් (Yellowstone) ජාතික උද්‍යානය, පෝට්-ඕ-ප්‍රින්ස්, කොරල් මුහුද, ටොන්කින් බොක්ක, මැගලන් සමුද්‍ර සන්ධිය, සඛාලින් දූපත, ලැබ්‍රඩෝර් ප්‍රවාහය, උගන්ඩා, බැග්ඩෑඩ්. (ලකුණු 15 යි)

(ආ)
- (i) වර්ෂ 2009 දෙසැම්බර් මස දේශගුණය වෙනස්වීම පිළිබඳ ලෝක සමුළුව පැවැති නගරය
- (ii) සමකයෙන් දකුණෙහි පිහිටි වඩාත්ම නාගරීකරණය වූ අප්‍රිකානු රට
- (iii) ලෝකයේ උසම දිය ඇල්ල
- (iv) චීනයේ ප්‍රධාන යකඩ හා වානේ නිෂ්පාදන මධ්‍යස්ථානයක්
- (v) වර්ෂ 2010 පෙබරවාරි මස දරුණු භූමිකම්පාවකට ලක්වූ දකුණු ඇමෙරිකානු නගරය (ලකුණු 05 යි)

## III කොටස

**3.** (අ) කුඩා භූමියක කරන ලද දම්වැල් මැනුමක් ඇසුරෙන් ලබාගත් තොරතුරු පහත දැක්වේ. එක් එක් මැනුම් රේඛාව සඳහා එම තොරතුරු මිනින්දෝරුවන් විසින් බිහිවැඩ පොත්වල සටහන් තබන **සම්මත පිළිවෙළ අනුව** ඉදිරිපත් කරන්න.

AB මැනුම් රේඛාව A ලක්ෂ්‍යයේ සිට මීටර 130 ක් දක්වා විහිදේ. එම රේඛාවෙහි දකුණු පසින් ප්‍රධාන මාර්ගයක් ඇත. AB රේඛාවෙහි A ලක්ෂ්‍යයේ දී මීටර 3 ක් දක්වා ද, මීටර 40 ක දුරක දී මීටර 6 ක් දක්වා ද, මීටර 105 ක දී මීටර 8 ක් දක්වා ද වූ අනුලම්බ මැනුම් මගින් ප්‍රධාන මාර්ගයෙහි විහිදීම දක්වේ. B ලක්ෂ්‍යයෙහි දී ද ඒ සඳහා මීටර 11 ක් දක්වා වූ තවත් අනුලම්බ මැනුමක් සිදු කර ඇත.

AB මැනුම් රේඛාවෙහිම A සිට මීටර 85 ක් සහ 91 අතරදී මීටර 6 ක් පළලැති අප්‍රධාන මාර්ගයක් මැනුම් රේඛාව හරහා වැටී ඇති අතර එය ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වේ. A ලක්ෂ්‍යයෙහි සිට මීටර 72 ක දුරක දී, AB රේඛාවට වම්පසින් මීටර 6 ක දුරින් විදුලි රැහැන් කණුවක් පිහිටා ඇත.

[ තුන්වෙනි පිටුව බලන්න.

BC මැනුම් රේඛාව මීටර 110 ක් දිගින් යුක්ත වේ. එම රේඛාවට දකුණු පසින් විහිදෙන අප්‍රධාන මාර්ගයකි. B ලක්ෂ්‍යයේ සිට මීටර 50 ක දී මීටර 3 ක් වූ ද, මීටර 65 ක දී මීටර 6 ක් වූ ද, C ලක්ෂ්‍යයේ දී මීටර 8 ක් වූ ද අනුලම්භ මැනුම් තුනක් මගින් එම අප්‍රධාන මාර්ගයෙහි විහිදීම දක්වේ.

C ලක්ෂ්‍යයේ සිට මීටර 115 ක් දක්වා CD මැනුම් රේඛාව විහිදේ. එම රේඛාවට දකුණු පසින් කම්බි වැටක් ඇත. C ලක්ෂ්‍යයේ සිට මීටර 12 ක දුරින් මීටර 2 ක් දක්වා ද, මීටර 40 ක දුරින් මීටර 6 ක් දක්වා ද, මීටර 90 ක් දුරින් මීටර 6 ක් දක්වා ද, ගනු ලැබූ අනුලම්භ මැනුම් මගින් එම වැටෙහි විහිදීම දක්වේ.

C ලක්ෂ්‍යයේ සිට මීටර 45 ක දුරකදී මීටර 9 ක් වූද, මීටර 58 ක දුරකදී මීටර 6 ක් වූ ද අනුලම්භ මැනුම් මගින් CD රේඛාවට වම් පසින් පිහිටි ගොඩනැගිල්ලක දෙකෙළවර දක්වේ.

DA මැනුම් රේඛාව D ලක්ෂ්‍යයෙහි සිට මීටර 95 ක් දිගින් යුක්තවේ. එම රේඛාවට දකුණු පසින් ඊට බොහෝදුරට සමාන්තරව වැටක් ඇත. එහි විහිදීම දක්වීම සඳහා අනුලම්භ මැනුම් තුනක් සිදුකර තිබේ. ඉන් පළමුවැන්න D ලක්ෂ්‍යයෙහි දී මීටර 9 ක් දක්වා මැන තිබේ. ඉන් දෙවැන්න D ලක්ෂ්‍යයේ සිට මීටර 90 ක දුරකදී මීටර 7 ක් දක්වාද, තුන්වැන්න A ලක්ෂ්‍යයේ දී මීටර 4 ක් දක්වාද දිගින් යුක්ත වේ.

CA මැනුම් රේඛාව මීටර 150 ක දිගින් යුක්ත වේ. ඊට වම් පසින් කර්මාන්ත ශාලාවක දෙකෙළවර දක්වීම සඳහා C ලක්ෂ්‍යයේ සිට මීටර 48 හා මීටර 82 ක දුරින් පිහිටි ස්ථානවලදී මීටර 11 බැගින් වූ අනුලම්භ මැනුම් දෙකක් සිදුකර ඇත.

C ලක්ෂ්‍යයේ සිට මීටර 71 ක දුරකදී CA මැනුම් රේඛාව හරහා අඩිපාරක් වැටී ඇත. C ලක්ෂ්‍යයෙහි සිට මීටර 95 ක දුරක දී මීටර 9 ක් දුරැති අනුලම්භ රේඛාවක් මගින් CA රේඛාවට දකුණු පස පිහිටි ළිඳක් දක්වේ.

C ලක්ෂ්‍යයේ සිට මීටර 88 ක දුරක දී, මීටර 6 ක් දුරැති අනුලම්භ රේඛාවක් මගින් CA රේඛාවට වම් පසින් පිහිටි විදුලි රැහැන් කණුවක් දක්වා ඇත. *(ලකුණු 06 යි)*

(ආ) පිඹුරු පතක් ඇඳීමේ දී **අන්තර් ඡේදන චාප රේඛා** මගින් ලැබෙන ප්‍රයෝජන රූපසටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 02 යි)*

(ඉ) දම්වැල් මැනුම් වලදී භාවිත වන, දම්වැල හා මැනුම් පටිය හැර වෙනත් උපකරණ **තුනක** රූපසටහන් ඇඳ දක්වා ඒවායේ ප්‍රයෝජන සඳහන් කරන්න. *(ලකුණු 06 යි)*

(ඊ) පහත සඳහන් ඕනෑම **දෙකක්** සම්බන්ධයෙන් කෙටි සටහන් ලියන්න.

(i) ත්‍රිකෝණිකරණය
(ii) පියගැට මැනුම
(iii) පියවුම් දේශ
(iv) ආවේක්ෂණ රේඛා
(v) ආරම්භක ලක්ෂ්‍යය

*(ලකුණු 06 යි)*

4. (අ) සිතියමක සමක්ෂේත්‍ර ගුණය ආරක්ෂාවන ප්‍රක්ෂේපණ **හතරක්** නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) ඉහත 'අ' හි දක්වන ලද ඕනෑම ප්‍රක්ෂේපණ **දෙකක** ලක්ෂණ සසඳන්න. *(ලකුණු 06 යි)*

(ඉ) රූප සටහන් ආධාරයෙන් සම්මත අක්ෂාංශ දෙකකින් යුක්ත කේතු ප්‍රක්ෂේපණය නිර්මාණය කරනු ලබන ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

(ඊ) පහත දක්වෙන ලක්ෂණ, සිතියම් මගින් දක්වීම සඳහා **වඩාත් සුදුසු** ප්‍රක්ෂේපණ **එකක්** බැගින් නම්කර, ඔබගේ තේරීම සඳහා හේතු දක්වන්න.

(i) චීනයෙහි භූමි පරිහරණ රටාව
(ii) ග්‍රීන්ලන්තයෙහි ග්ලැසියර්
(iii) මැදපෙරදිග රටවල ඛනිජතෙල් ළිං
(iv) නිවර්තන වැසි වනාන්තර

*(ලකුණු 04 යි)*

## IV කොටස

**වගුව 1**

5. **ශ්‍රී ලංකාවේ ජනාධිපති කාර්යසාධක බලකාය යටතේ 1994 දෙසැම්බර් 31 දින දක්වා ඉඩම් බෙදීම**

| පළාත | හැඳිනගත් ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර) | යෝග්‍ය ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර) | බෙදුන් ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර) |
|---|---|---|---|
| බස්නාහිර | 2 648 | 2 648 | 2 648 |
| මධ්‍යම | 10 170 | 7 786 | 7 786 |
| දකුණ | 14 183 | 12 810 | 12 809 |
| උතුර හා නැගෙනහිර | 31 707 | 31 707 | 8 700 |
| වයඹ | 34 376 | 30 260 | 30 260 |
| උතුරු මධ්‍යම | 110 332 | 69 684 | 42 738 |
| ඌව | 46 458 | 36 978 | 26 711 |
| සබරගමුව | 14 444 | 12 699 | 8 570 |

මූලාශ්‍රය : Ministry of Agriculture, Lands and Forestry, 1996

(අ) **වඩාත්ම යෝග්‍ය** සිතියම් විද්‍යාත්මක ක්‍රමය මගින් වගුව 1 හි දක්වෙන දත්ත නිරූපණය කරන්න. (ලකුණු 10 යි)

(ආ) පහත දක්වෙන සිතියම් විද්‍යාත්මක ක්‍රම අතරින් **දෙකක්** තෝරාගෙන, ඒවා නිර්මාණය කරන ආකාරය හා ඒවායේ ප්‍රයෝජන කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් කටුසටහන් ආශ්‍රයෙන් විස්තර කරන්න.

(i) තිත් සිතියම්

(ii) ධාරා සිතියම්

(iii) සම සංඛ්‍යා සිතියම්

(iv) රේඛාංකිත සිතියම් (ලකුණු 10 යි)

6. (අ) 2 වගුවෙහි දක්වා ඇති, කළුතර දිස්ත්‍රික්කයෙහි වසර 20 ක කාලය තුළ යල කන්නයේ වී අස්වැන්න පිළිබඳ දත්ත නිරූපණය සඳහා අපගමන ප්‍රස්තාරයක් නිර්මාණය කරන්න. (ලකුණු 06 යි)

**වගුව 2**

**කළුතර දිස්ත්‍රික්කයෙහි යල කන්නයේ වී අස්වැන්න 1989 – 2008 (හෙක්ටයාර 1 ට කිලෝ ග්‍රෑම්)**

| වර්ෂය | අස්වැන්න | වර්ෂය | අස්වැන්න |
|---|---|---|---|
| 1989 | 2418 | 1999 | 2488 |
| 1990 | 2334 | 2000 | 2661 |
| 1991 | 2108 | 2001 | 2734 |
| 1992 | 2319 | 2002 | 2546 |
| 1993 | 2059 | 2003 | 2376 |
| 1994 | 2305 | 2004 | 2312 |
| 1995 | 2327 | 2005 | 2335 |
| 1996 | 2184 | 2006 | 2693 |
| 1997 | 2574 | 2007 | 3060 |
| 1998 | 2696 | 2008 | 2743 |

මූලාශ්‍රය : Paddy Statistics, Department of Census and Statistics, Sri Lanka

මධ්‍යන්‍යය : 2464

(ආ) ඔබ නිර්මාණය කළ ප්‍රස්තාරය මගින් දක්වෙන වී අස්වැන්නෙහි උච්චාවචනයන්හි ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ඉ) 'ඔගිව්' ප්‍රස්තාරයක් නිර්මාණය කරනු ලබන ආකාරය සහ දත්ත ඉදිරිපත් කිරීමේ දී ඉන් ලැබෙන ප්‍රයෝජන විස්තර කරන්න. (ලකුණු 06 යි)

(ඊ) සංඛ්‍යා ශ්‍රේණියක පහත දක්වෙන දෑ හැඳින්වීම සඳහා භාවිත වන සංඛ්‍යාන විද්‍යාත්මක යෙදුම් නම් කරන්න.

(i) එකම අගය වැඩිම වාර ගණනක් පැවතීම

(ii) ආරෝහණ හෝ අවරෝහණ පිළිවෙළින් සැකසූ සංඛ්‍යා ශ්‍රේණියක මධ්‍යයෙහි පිහිටි අගය

(iii) ප්‍රථම සහ තුන්වන චාතුර්ථක අගයන් අතර වෙනස

(iv) සංඛ්‍යාත ව්‍යාප්තියක දත්ත අසමාන ලෙස පැතිරීම (ලකුණු 02 යි)

(උ) භූගෝල විද්‍යාත්මක අධ්‍යයනවලදී ප්‍රාථමික දත්ත භාවිතයෙහි වාසි සඳහන් කරන්න. (ලකුණු 02 යි)

[ පස්වෙනි පිටුව බලන්න.

7. 1871 සිට 2031 (ප්‍රක්ෂේපිත) දක්වා ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යා වර්ධනය සහ වාර්ෂික සාමාන්‍ය ජනසංඛ්‍යා වර්ධන ශීඝ්‍රතාව අංක 1 රූප සටහනින් දක්වා ඇත.

**අංක 1 රූප සටහන**

**ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යා වර්ධනය හා වාර්ෂික සාමාන්‍ය ජනසංඛ්‍යා වර්ධන ශීඝ්‍රතාව 1871 සිට 2031 (ප්‍රක්ෂේපිත) දක්වා**




*මූලාශ්‍රය* : Department of Census and Statistics.

(අ) අංක 1 රූප සටහන සඳහා භාවිත කර ඇති සිතියම් විද්‍යාත්මක ක්‍රමය නම් කරන්න. *(ලකුණු 01 යි)*

(ආ) පහත දක්වෙන කාල පරිච්ඡේදයන්හි පැහැදිලි වන ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ප්‍රධාන ලක්ෂණ **තුනක්** සාකච්ඡා කරන්න.

- 1871 - 1921
- 1931 - 1971
- 1981 - 2031

*(ලකුණු 06 යි)*

(ඉ) ඉහත (ආ) කොටසේ දක්වා ඇති කාල පරිච්ඡේදවල ශ්‍රී ලංකාවේ වාර්ෂික සාමාන්‍ය ජනසංඛ්‍යා වර්ධන ශීඝ්‍රතාවෙහි ප්‍රධාන ලක්ෂණ **තුනක්** සාකච්ඡා කරන්න. *(ලකුණු 06 යි)*

(ඊ) අංක 1 රූප සටහනෙහි ප්‍රස්තාර දෙකෙහි දක්වෙන ජන සංඛ්‍යා වර්ධනයේ සහ එහි වර්ධන ශීඝ්‍රතාවේ උපනතීන්හි වෙනස්කම් හැඳිනගෙන ඒවාට හේතු පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

***

25859

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**22 | I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

**භූගෝල විද්‍යාව I (ප්‍රායෝගික භූගෝල විද්‍යාව)**
**புவியியல் I (செய்முறைப் புவியியல்)**
**Geography I (Practical Geography)**

ප්‍රශ්න අංකය : 1 (ආ)
வினா இல : 1 (ஆ)
**Question No : 1 (b)**

විභාග අංකය
சுட்டெண்
**Index No.** ....................................




පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි
பரீட்சகரின் உபயோகத்திற்கு மட்டும்
Examiner's Use Only

| | |
|---|---|
| i | |
| ii | |
| iii | |
| iv | |
| v | |
| vi | |
| vii | |
| viii | |
| ix | |
| x | |
| xi | |
| එකතුව<br>மொத்தம்<br>Total | |

ප්‍රශ්න අංකය
வினா இல
Question No. } 2

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

22 | I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

භූගෝල විද්‍යාව I (ප්‍රායෝගික භූගෝල විද්‍යාව)
புவியியல் I (செய்முறைப் புவியியல்)
Geography I (Practical Geography)

විභාග අංකය
சுட்டெண்
Index No. } ..............................



25859

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු භූගෝල විද්‍යාව I (ප්‍රායෝගික භූගෝල විද්‍යාව)

கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற் புவியியல் I (செய்முறைப் புவியியல்)

General Certificate of Education (Adv. Level) Examination, August 2010 Geography I (Practical Geography)




Scale : 1 : 50 000

සමෝච්ච රේඛා අන්තරය අඩි 100

சமவுயரக்கோட்டு இடைவெளி 100

Contour Interval 100 feet